# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1767/21 – 2012 ජූලි 19 වැනි බ්‍රහස්පතින්දා – 2012.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/10/44/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

පී. තිලකරත්න මයා, අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන අංශය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය, ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, පන්නිපිටිය පාර, අංක 77හි ටී. පියසෝම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 ජූලි මස 10 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/10/44/2011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

පී. තිලකරත්න මයා, අභ්‍යන්තර විගණක, අභ්‍යන්තර විගණන අංශය, ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

සහ

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ –**

ලංකා විදුලිබල මණ්ඩලයේ සේවය කරනු ලබන පී. තිලකරත්න මහතා හට දේශපාලන කමිටු වාර්තාවට අනුව 2004.10.01 දිනට ලබා දෙන ලද අභ්‍යන්තර විගණක තනතුර ඔහු පෙර දැරූ අභ්‍යන්තර විගණක සහකාර තනතුරෙන් ලද උසස්වීමක් වුවද ආයතනයේ සාමාන්‍යාධිකාරිගේ උසස්වීම් හා බඳවා ගැනීම් සම්බන්ධ අංක 1999/ජීඑම්/18/එච්ආර්ඩී හා 1991.05.31 දිනැති, අංක 2001/ජීඑම්/18(1)/එච්ආර්ඩී හා 2001.01.11 දිනැති චක්‍රලේඛ සහ 2002/ජීඑම්/32(1) ප්‍රතිපත්ති හා 2002.10.29 දිනැති චක්‍රලේඛය ක්‍රියාත්මක නොකිරීම නිසා 1984 වර්ෂයේ සිට 2004 වර්ෂය දක්වාම උසස්වීම් නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී ඇත්ද යන්න හා එසේ වී ඇත්නම් ඔහු ඉල්ලා ඇති පරිදි අභ්‍යන්තර විගණක තනතුර 1990.06.05 දිනට පෙරදාතම් කිරීම හා ඉල්ලා ඇති හිඟ වැටුප්, දීමනා ආදිය ලබා දියයුතුද, නොඑසේ නම් ඔහුට ලබාදිය හැකි වෙනත් සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 ජූලි මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 - 121

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.